# ඩෝරා



ශනෙලි බණ්ඩාර

# ඩෝරා

## ශනෙලි බණ්ඩාර

කතෘ

## කතෘගේ වෙනත් කෘති

## පුංචි සරෝජා

මහනුවර මහාමායා බාලිකා විදුහල

4-C

17/03/2025

ISBN 978-624-211-180-3

# පිදුම

මේ පොත නිමර්ාණය කිරීමට මට උදව් වුණ
මගේ සහෝදරයාට, මම මේ පොත ආදරයෙන්
පුද කරමි

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026-05-10

ගසවලින් පිරුණු කුඩා කඳු මුදුනක පිහිටි ඩෝරාගේ ගෙදර හරිම ලස්සනයි.



ඩෝරාට අම්මායි,තාත්තායි, මල්ලි, අයියායි හිටියා. පුංචි ඩෝරාගේ තාත්තා ඉගුරු වගා කරන ගොවි මහත්තයෙක්.

ඩෝරාගේ අම්මා තමයි තාත්තාට උදව් කරන්නේ.



අම්මායි,තාත්තායි හරිම ආසාවෙන් ගොවිතැන් කටයුතු කරනවා දැකපු පුංචි ඩෝරාට මෙහෙම හිතුණා

‘ලබන පාසල නිවාඩුවට මමත් පුංචි ගොවිපොලක්’

කාලය ගතවෙලා පාසල් නිවාඩුව ලැබුණා.අම්මායි, තාත්තායි දරුවෝ එන කන බලා සිටියා. දරුවෝ




තිදෙනාම සතුටින් පාසල ඇරි ගෙදර එනවා දැකපු අම්මාටයි,තාත්තාටයි හරිට පුදුම වුණා

‘ඇයි මගේ දරුවො මෙතරම් සතුටින්?’අම්මා ඇසුවා.

‘අම්මේ අපි තිදෙනාම හොඳටම විභගෙයට ලකුණු ගත්තා.’ඩෝරා කිව්වා.

‘ මම තමයි හොඳටම අරගෙන තියෙන්නේ’අයියා කිව්වා.

‘මගේ දරුවනට දෙවි පිහිටයි.’අම්මා තනියම කියා ගත්තා. ‘මගේ දරුවනට මොනවාද ඕනි?’

‘අම්මා අපිට පුංචි ගොවිපොලක් ඕනි’ අයියා කිව්වා.

‘ඇයි පුතේ අපිට ගොවිපොලක් තියෙන්නේ’ අම්මා කිව්වා.




‘නැහැ අම්මේ අපි තිදෙනාටත් අම්මායි,තාත්තායි ගොවිපොලක් හදන්න ඕනේ.එකට අපිට උදව් කරන්න,අපිට වෙන්න මුකුත් ඕනේ නැහැ’දරුවන් සියලුම දෙනාම කිව්වා.

‘ඔයාලට පාසල් නිවාඩුව ලැබුණානෙ මම තාත්තාගෙන් අහලා කියන්නම්’ අම්මා කිවුවා.

රාත්‍රිය උදා වුණා.අපි කෑම කා, අම්මා සහ තාත්තා සමග කතා කරලා අපිට ඒ අවස්ථාව ලබුණ්නා.



අපි උදෑසන අවදී වී මුණ කට සොදා උදෑසන ආහාර ගෙන.



පසු ගොවිපොලට යන්න උදලු, කැති, පිහි සහ කැම සියල්ලම සූදනම් කරගත්තා.අපි තිදෙනාම අම්මායි, තාත්තායි වගේම




අපිත් අපේ පුංචි

ගොවිපොලේ වැඩ

පටන් ගත්තා.අපි

ලස්සනට පාත්ති

හැදුවා. අපිට ලොකු

අස්වැන්නක් ලැබුණා. අපි මාසයක් විතර ගොවිතැන් කටයතු කළා ගත වුණා.පුංචි ගොවිපොලේ බටු,කැරට්, අල,ලීක්ස් වගේ දේවල් හැදිලා ඩෝරාටයි,මල්ලිටයි, මල්ලිටයි හරිම සතුටුයි. තිදෙනාම හරිම සතුටුන් පාසල් ගියා.ඩොරා එයාගේ යාළුවන්ට අස්වැන්න ලබා දුන්නා.




ඩොරා, මල්ලි සහ අයියා  පාසලට ගියේ හරිම සතුටින්. ඩොරාගේ අතේ තිබුණේ එයාගේ ගෙවත්තේ හැදුණු ලස්සන, රසවත් එළවළු පිරුණු කූඩයක්.




පාසලට ගිය ගමන් ඩොරා තමන්ගේ යාළුවෝ හැමෝම එකතු කරගත්තා. "යාලුවනේ, බලන්න මම අද මොනවද ගෙනාවේ කියලා! මේවා මගේ වත්තේ අපිම වගා කරපු දේවල්," ඩොරා හිනාවෙලා කිව්වා.



මල්ලි උදව් කළා කූඩයේ තිබුණු  බටු,කැරට්, අල සහ ලීක්ස් යාළුවෝ අතරේ බෙදන්න.





හැම යාළුවෙක්ටම නැවුම් එළවළුක් ලැබුණා. යාළුවෝ හැමෝම සතුටින් ඒවා කන්න පටන් ගත්තා. "අනේ ඩොරා, මේවා හරිම රසයි!" ඩොරාගේ යාළුවෝ සතුටින් කිව්වා.'පොළොවට ආදරය කිරීමෙන් තමයි මෙවා ලැබුණෙ.'ඩොරා කිව්වා



පාසලේ විවේක වෙලාවේදී ගුරුතුමිය ඩොරාගෙන් ඇහුවා කොහොමද මේ තරම් ලස්සන අස්වැන්නක් ලැබුණේ කියලා. ඩොරා හැමෝටම ඇහෙන්න මෙහෙම කිව්වා.

"අපි පැළවලට හැමදාම වතුර දැම්මා. ඒවාට ආදරය කළා. වටේ තිබුණු වල් පැළෑටි ඉවත් කළා. අන්තිමේදී අපිට මේ වගේ රසවත් එළවළු ලැබුණා."

එතකොටම  මල්ලිට අපූරු අදහසක් ආවා. "අපි ඇයි අපේ පාසල් වත්තේත් මේ වගේ වගාවක් පටන් නොගන්නේ?" හැම යාළුවෙක්ම ඒකට කැමති වුණා. ගුරුතුමියත් සතුටින් ඉඩ ලබා දුන්නා.





එකතු වෙලා පාසල් වත්තේ කුඩා කොටසක් සකස් කළා. ඩොරා ගෙදරින් අරන් ආපු බීජ වගර් යාළුවෝ හැමෝම එකතු වෙලා හිටෙව්වා. සමහරු වතුර දැම්මා, තවත් සමහරු පස් පීරුවා. හැමෝම වැඩ කළේ හරිම එකමුතුවෙන්. දින කිහිපයකින් පුංචි පැළ පස් අතරින් එලියට ආවා. ඒක දැක්කම ළමයින්ට දැනුණේ පුදුම සතුටක්.



මාස කිහිපයකට පස්සේ, මුළු පාසල් වත්තම එළවළුවලින් සහ මල්වලින් පිරිලා ගියා. ඩොරා තමන්ගෙ යාළුවන්ට අස්වැන්න බෙදා දීමෙන් පටන් ගත්තා ඒ සතුට, දැන් මුළු පාසලටම අස්වැන්න දෙන ලොකු වගාවක් වෙලා.



වැඩ අවසානයේ ඩොරා ඇහුවා, "යාලුවනේ, අද අපි මොනවද ඉගෙන ගත්තේ?"

යාළුවෝ හැමෝම එක හඬින් කිව්වා, "එකමුතුකම සහ බෙදාහදා ගැනීම අපිට ලොකු සතුටක් ගේනවා!"



කතාවේ අර්ථය: එකමුතුකම සහ බෙදාහදා ගැනීම.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාරv ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-180-3